**නොවැම්බර් මස 15 වැනි දින ජිනීවා නුවර පැවති තුන්වැනි විශ්ව කාලාන්තර සමාලෝචනයේ දී ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිලිබඳ නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා කළ ප්‍රකාශය.**

**උප සභාපතිතුමනි,**
**සම්භාවනීයනි,**
**ගෞරවනීය නියෝජිතයිනි,**

- අප රට සඳහා වන තෙවැනි විශ්ව කාලාන්තර සමාලෝචනයට සහභාගී වන ශ්‍රී ලංකා නියෝජිත පිරිසෙහි නායකත්වය දරමින් අද මෙහි පැමිණීමට ලැබීම ගැන මම සතුටු වෙමි. ලාංකික නියෝජිත පිරිසට විදේශ කටයුතු අමාත්‍යාංශයේ, නීතිපති දෙපාර්තමේන්තුවේ, ජනාධිපති කර්යාලයේ සහ ජිනීවා හි පිහිටි එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිළධාරීන් ඇතුළත්ය.

**උප සභාපතිතුමනි,**
**ගෞරවනීය නියෝජිතයිනි,**

- ශ්‍රී ලාංකීය ජනතාව විසින් 2015 ජනවාරි මස 08 සහ අගෝස්තු මස 15 වැනි දිනවල පැවති ඓතිහාසික මැතිවරණයන්හි දී ශ්‍රී ලංකාවේ ජනතාව විසින් මෙහෙයවනු ලැබූ නව්‍යකරණය වූ හා පරිවර්තිත දේශීය වාතාවරණයක් සහිත පසුබිමක ශ්‍රී ලංකාව මෙම සමාලෝචනයට සහභාගී වෙයි. අප රටේ ජනතාව සිය ඡන්ද ලබා දුන්නේ මානව හිමිකම් ශක්තිමත්කර, ප්‍රවර්ධනයකර, ආරක්ෂාකර හා ඉහළට ඔසවා තැබීමටත්, ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය සහ නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීමටත්, සංහිඳියාව සහ තිරසර සාමය සඳහාත් , සැමට සාධාරණත්වය හා ස්වාභිමානය ලබාදීමටත් ලබාදීම ,සමාජයේ බහුවිධ ස්වභාවය ඉස්මතු කරලීමට, සහ මෙරටේ සමානාත්මතාවයෙන් යුත් සියල්ලන් ඇතුළත් ආර්ථික වර්ධනය හා සංවර්ධනය වෙනුවෙනුත් ය.
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂ වන ජනාධිපති සිරිසේන මහතා නායකත්වය දෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා නායකත්වය දෙන එක්සත් ජාතික පක්ෂයත් ඒකාබද්ධ කරමින් මෙරට දේශපාලන සංස්කෘතියේ ප්‍රමුඛ වෙනසක් ඇති කිරිමට 2015 ජනවාරි මස 08 වැනි දින පැවැති ජනාධිපතිවරණයෙන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ලැබූ ජයග්‍රහණයට හැකි විය.මේ ආකාරයෙන් බිහි වූ ජාතික සම්මුතිවාදී රජය, එතෙක් කලක් ශ්‍රී ලංකාව අනුගමනය කළ හුදකලාවාදී ප්‍රතිපත්තිය පසෙකලමින්, මානව හිමිකම් ආශ්‍රිත ගැටලු පිළිබඳ කටයුතු කිරීමේ දී මෙරට වැසියන් මෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ජාත්‍යන්තර ප්‍රජාව සමඟ ද පුළුල් විවෘතභාවයකින් යුතුව ක්‍රියා කිරීමට කටයුතු කළේය. එබැවින් මෙම තෙවැනි විශ්ව කාලාන්තර සමාලෝචනයට වෙනුවෙන් සහභාගී වන ශ්‍රී ලංකාව වනාහී හිමිකම් සම්බන්ධයෙන් නව, ධනාත්මක හා ප්‍රගතිශීලී මාවතක ගමන් කරන රටකි.අප මෙම සැසිවාරයට සහභාගි වනුයේ:

- නව්‍යකරණය වූ ක්‍රියාකාරී මානසිකත්වයකින්,
- දේශීය හා ජාත්‍යන්තර වශයෙන් සාමාන්‍ය ජනතාවගේ මානව හිමිකම් ප්‍රවර්ධනයට, ආරක්ෂා කිරීමට හා ඉහළට ඔසවා තැබීමට නවමු විශ්වාසයකින් හා කැපවීමකින්,

- සාමාන්‍ය ජනතාවගේ ශුභ සිද්ධිය උදෙසා ආවර්ජනය කිරීමට, ඉගෙනීමට, සහ වෙනස්කම් සිදු කිරීමට විවේචන අපට පිටුවහලක් සපයන බැවින් විවේචන ද ඇතුළු ව අන්‍යයන්ගේ මතවලට සවන් දෙන පුළුල් විවෘතභාවයකින් සහ
- සැම පුරවැසියෙකුගේම අයිතිවාසිකම් ආරක්ෂා කෙරෙන, සැමගේ ගෞරවනීයත්වය වෙනුවෙන් කැපවූ, සංහිඳියාව උදාකරගත් , ස්ථාවර, සාමකාමී සශ්‍රීක දේශයක් බවට අපගේ රට පත් කිරීමට ඇති තිර අදිටනින් යුතුවය.

**ගෞරවනීය නියෝජිතයිනි,**

- ❖ ඔබ සැවොම දන්නා පරිදි, අභියෝගවලින් තොර, සර්ව සම්පූර්ණ රාජ්‍යයක් කොතැනකවත් නොමැත. අප හඳුනාගෙන ඇති පරිදි මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම යනු නිරන්තර ක්‍රියාවලියකි.කෙතරම් කැපවීමකින් හා අධිෂ්ඨානයෙන් යුතුව ක්‍රියා කළද, එය එක් රැයකින් කළ හැක්කක් නොවේ. අපගේ මතය අනුව විශ්ව කාලාන්තර සමාලෝචනය යනු මෙම කරුණු හඳුනාගත්, ස්වයං සමාලෝචනය කර ගැනීමට එකිනෙකාට අත දෙන, වඩා හොඳ පරිචයන් හුවමාරු කරගත හැකි, අපගේ පුරවැසියන්ගේ අවශ්‍යතාවයන් වඩා ඵලදායි අයුරින් ආමන්ත්‍රණය කිරීමට එකිනෙකා හට සහාය වීමට පවත්නා ක්‍රමවේදයකි. මානව හිමිකම් වෙනුවෙන් ජාතික සම්මුතිවාදී රජය කොතෙක් දුරට කැපවී ඇත්ද යන්න ගැන දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බොහෝ දෙනා ප්‍රශ්න කරති. සැබවින් ම එම නොඉවසිලිමත්භාවය ස්වභාවිකය; ප්‍රශ්න කිරීම ස්වභාවිකය; බලාපොරොත්තු විරහිතවීම ද ස්වභාවිකය. ඇතැමුන් එසේ විවේචනය කරන්නේ යෙදෙනුයේ ශ්‍රී ලංකාවේ උන්නතිය උන්නතිය සිතෙහි තබාගෙන බව අප හොඳාකාරව ම දන්නෙමු.

  ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් තුළ පහසුවෙන් කඩිනම් වෙනස්කම් සිදු කිරීම, ඍජු හා කලින් හඳුනාගත් මාවතක් ඔස්සේ කඩිනමින් ගමන් කිරීම අසීරු කටයුත්තකි. ගෝලීය භූමිකාව තුළ සිදුවන වෙනස්කම්, ආර්ථික බලපෑම්, ස්වභාවික ආපදා, දේශපාලන වෙනස්කම් යන සැම දෙයක් ම අපගේ යහපත් ආධ්‍යාශයන් කෙරේ බලපෑමක් ඇති කරයි. ආයතනික වශයෙන් අප ප්‍රශස්ත මට්ටමේ නැත. අප මෙය හඳුනාගෙන ඇත. එසේ ම පරිපාලනමය හා පුහුණු කිරීමේ අංශයන්ගේ අවශ්‍යතාවන් හඳුනා ගැනීමට හා අපගේ ආයතන ශක්තිමත් කිරීමට සිදු කළ යුතු සංශෝධන සඳහා අපි නිරන්තරයෙන් ප්‍රයත්න දරන්නෙමු. පුරවැසියන්ට අපගේ ආයතනවලින් වඩා යහපත් සේවයක් සැළසීම සඳහා කළ යුතු ධනාත්මක වෙනස්කම් ඇති කිරීමට පුද්ගලයින් පෙළඹවීමට පියවර ගනිමින් සිටින්නෙමු. අපගේ පුළුල් දැක්ම හා අධිෂ්ඨානය වනුයේ අපගේ සමස්ත පුරවැසියන්ට ප්‍රතිලාභ ලැබිය හැකි අයුරින් වෙනස්කම් සිදු කිරීම වන අතර වෙනස්කම් සඳහා ධනාත්මක පියවර ගැනීමට උපේක්ෂාවෙන් හා අවවාදාත්මක අයුරින් අන්‍යයන්ට සවන් දීමට විවෘතභාවයෙන් කටයුතු කරමු.

- ❖ වත්මන් සැසිවාරයේ දී ශ්‍රී ලංකාව සමග කටයුතු කිරීමට රාජ්‍යයන් දැක්වූ උනන්දුව අපගේ ප්‍රශංසාවට ලක් වේ. වඩා කේන්ද්‍රීය හා ඵලදායි සාකච්ඡාවක් සඳහා කල් තබා ප්‍රශ්න යොමු කරන ලද සියලු රාජ්‍යන්ට මාගේ ස්තුතිය පළකරන්නෙමි.

- ❖ ඔබ දන්නා පරිදි, 2012 වසරේ කළ විශ්ව කාලාන්තර සමාලෝචනයෙහි පටන් ශ්‍රී ලංකාව සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන තිබේ. මෙම ප්‍රගතියෙන් වැඩි ප්‍රමාණයක් අත්පත් කරගත්තේ ජාතික සම්මුතිවාදී රජය නිර්මාණයවීමට හේතු වූ 2015 ජනවාරි මස පැවැති ජනාධිතිවරණය හා 2015 අගෝස්තු මස පැවැති පාර්ලිමේන්තු මැතිවරණයේ සිට ගත වූ දළ වශයෙන් වසර 2ක් හා මාස 10ක් වැනි කෙටි කාලයක් තුළ බව ඔබට පෙනෙනු ඇත. රජය ජනතාවට දුන් ප්‍රතිඥා සැබෑ කරනු පිණිස ගතයුතු වූ තීරණ ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති අනුගතභාවයට හා ස්ථාවරත්වයට මෙම සම්මුතිවාදී රජය පහසුකම් සැපයීය. නූතන හා තිරසර ආර්ථිකයක් සහිත, සියල්ල ඇතුළත් විනිවිදභාවයකින් යුත් පාලනයක් ඇති,අයිතීන් සුරකින හා සියල්ලන්ට සමානාත්මතාවෙන් සලකන රටක් ගොඩනැගීම මෙහිදී විශේෂ වේ.

## 2. ජාතික වාර්තාව: නව ප්‍රමිතීන් සැකසීම

**උප සභාපතිතුමනි,**

- ❖ අගෝස්තු මාසයේ දී ඉදිරිපත් කරන ලද, අද ඔබතුමා ඉදිරියේ ඇති විශ්ව කාලාන්තර සමාලෝචනය සඳහා වූ ජාතික වාර්තාව සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රියා පිළිවෙළ පසුගිය 2008 හා 2012 වර්ෂවල දී අනුගමනය කරන ලද පරිචයෙන් මූලික වශයෙන් වෙනස් වෙයි.
- ❖ විවෘත හා විනිවිදභාවයෙන් යුතු ක්‍රියාවලි සඳහා අපගේ ඇති කැපවීමත් අපගේ පුරවැසියන් සමඟ කටයුතු කිරීමට අප දක්වන ගෞරවයත්, ප්‍රතිපත්ති සම්පාදනයේ දී පහළ සිට ඉහළටගමන් කරන ප්‍රවේශයක් සඳහාත් අප තුළ ඇති ඇප කැප වීම පෙන්නුම් කරමින් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු, සිවිල් සමාජ නියෝජිතයින්, හා විවිධ ක්ෂේත්‍රවල විශේෂඥයින් සම්බන්ධ කරමින් පෘථුල හා සියල්ල ඇතුළත් අදහස් විමසීමේ ක්‍රියාවලියක් අපි දියත් කළෙමු. එසේ කිරීමෙන් විශ්ව කාලාන්තර සමාලෝචනය සඳහා ශ්‍රී ලංකාවේ ජාතික වාර්තා සකස් කිරීම සඳහා නව ප්‍රමිතීන් අපි දැන් සකසා ඇත්තෙමු. මෙම ක්‍රියාවලිය අදියර දෙකකින් සමන්විත විය.

<u>පළමු අදියරයේ දී,</u> නව ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මට පදනම් වූ අදහස් විමසීම ක්‍රියාත්මක විය. මීට පෙර කරන ලද සමාලෝචන චක්‍ර දෙකේ දී ඉදිරිපත් කරන ලද නිර්දේශ මෙම ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරන ලදී. ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේ ක්‍රියාවලියට මඟ පෙන්වීම සඳහා රජය හා සිවිල් සමාජය නියෝජනය කරමින් සම්බන්ධීකරණ කමිටු දෙකක් පිහිටුවනු ලැබූ අතර වාර්තාව සැකසීම සම්බන්ධයෙන් පෘතුල ලෙස අදහස් විමසනු ලැබිණි. තේමාගත පරිච්ඡේද සැකසීම සඳහා රජයේ සහ සිවිල් සමාජ නියෝජිතයින්ගෙන් සමන්විත කෙටුම්පත් කමිටු දහයක් පිහිටුවීම අන්තර් ජාලය ඔස්සේ ජනතාවගේ නිර්දේශ ලබාගැනීම, නිර්දේශ හා මත ඉදිරිපත්කිරීම සඳහා සිවිල් සමාජය හා පුරවැසියන් සඳහා මහජන ප්‍රචාරණ පැවැත්වීම සහ ක්‍රියාකාරී සැලැස්ම අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට පෙර එය අමාත්‍යාංශ, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම හා එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන අතර සංසරණය කිරීමට මෙම ක්‍රියාවලියට ඇතුළත් විය.

දෙවන අදියරට අයත් වූයේ,; කෙටුම්පත් ජාතික වාර්තාව සැකසීම; ඒ පිළිබඳව අදහස් විමසීම සඳහා එය අන්තර් ජාලයෙහි ප්‍රසිද්ධ කිරීම. අදහස් ඉදිරිපත් කරන ලෙස ජනතාවගෙන් ඉල්ලමින් ප්‍රවෘත්ති පත්‍රවල දැන්වීම් පළකිරීම; හා රටෙහි විවිධත්වයට ගරු කරමින් කොළඹ, මහ නුවර, ගාල්ල, යාපනය හා කල්මුනේ යන නගර පහේ දී ජනතාවගෙන් සෘජුවම අදහස් විමසීම යන පියවරයි.

**3. සියලු දෙනාගේම මානව හිමිකම් සුරක්ෂිත කිරීම පිණිස අතීතය සමග කටයුතු කිරීම ආරක්ෂා කිරීමට අතීත අත්දැකීම් පිළිබඳ සොයා බැලීම, මානව හිමිකම් කවුන්සිලය සහ එක්සත් ජාතීන්ගේ පද්ධති හා පරිපාටීන් සමඟ ඇතිකරගත් නව සබඳතා.**

**උප සභාපතිතුමනි,**

- සෑම පුරවැසියෙකුගේ ම මානව හිමිකම් ප්‍රතිෂ්ඨාපනය කිරීමට සහ ආයතන ශක්තිමත් කිරීමේ හා නීතියේ ආධිපත්‍ය පිළිබඳ සියලුම පුරවැසියන් තුළ විශ්වාසය ගොඩනැගීමේ මාර්ගයක් ලෙස අතීතයේ සිදුවන්නට ඇතැයි විශ්වාස කරන ප්‍රචණ්ඩ ක්‍රියා සහ වාර්තා වූ වැරදි සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට රජය දක්වන කැපවීම විදහා පාමින් ජාතික ආණ්ඩුව සත්‍ය සෙවීම, යුක්තිය, හානිපූරණය සහ ගැටුම් නැවත ඇති නොවීම පිළිබඳ ක්‍රියාදාමයක් වෙනුවෙන් සිය කැපවීම ප්‍රකාශයට පත් කළේය.
- සෑම වසරකම නැවත නැවතත් ඡන්ද විමසීම් සිදු කරමින් පසුගිය ආණ්ඩුව මානව හිමිකම් කවුන්සිලය සමග පැවැත් වූ කටුක සබඳතාව අවසන්කොට අපගේ අතීත සිදුවීම් සම්බන්ධයෙන් විමසා බැලීම සඳහා වූ යෝජනා ජාතික සම්මුතිවාදී රජය කවුන්සිලය වෙත ඉදිරිපත් කළ අතර, ශ්‍රී ලංකාවේ සම අනුග්‍රාහකත්වය දක්වන 30/1 යෝජනාවලිය 2015 ඔක්තෝබර් 1 වන දින පොදු එකඟත්වය මත සම්මත කර ගැනීමට සියලුම පාර්ශ්ව සමඟ කටයුතු කළේය.
- රජය විසින් යෝජනා කොට ඇති පරිදි, ප්‍රවිචාරණ ක්‍රියාවලියකින් පසු, පාර්ලිමේන්තු පනත් මගින් අතුරුදන් වූ පුද්ගලයින් පිළිබඳ නිත්‍ය කාර්යාලයක්, සත්‍ය සෙවීමේ කොමිසමක්, විශේෂ නීති උපදේශකයෙකු සහිත අධිකරණ යාන්ත්‍රණයක් සහ හානිපූරණ කාර්යාලයක් ස්ථාපනය කිරීම සිදු කරනු ඇත. මේ වසරේ මාර්තු මාසයේ දී 34/1 යෝජනාවලිය පොදු එකඟත්වය මත සම්මත කිරීම හරහා 30/1 යෝජනාවලියේ කාල සීමාව වසර දෙකකින් දීර්ඝ කර ගැනීමට ද ශ්‍රී ලංකාව, කවුන්සිල සාමාජිකයින් සමග කටයුතු කළේ ය.
- සංහිඳියා යාන්ත්‍රණ ක්‍රියාත්මක වන්නේ සමස්ත ශ්‍රී ලාංකිකයින් සඳහා වන අතර එමගින් සියලු දෙනාටම එක හා ප්‍රතිලාභ අත්කර දීමට අපේක්ෂා කෙරේ. ගැටුම් සමයේ දී, මානව හිමිකම් සහ මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම පිළිබඳ, චෝදනා විමර්ශනය කිරීම සම්බන්ධයෙන්, විශේෂයෙන්ම ඒවා ආරක්ෂක හමුදා ඉලක්ක කරගන්නේය යන වැරදි වැටහීමක් මගේ රටේ සමහරක් තුළ ඇත. එහෙත් එය සම්පූර්ණයෙන්ම සාවද්‍යය. ශ්‍රී ලංකා ජනාධිපතිවරයා මෑතක දී අවධාරණය කළ පරිදි, ආරක්ෂක හමුදා අසාධාරණ ලෙස ඉලක්ක කර ගැනීම හෝ ඔවුනට දඬුවම් දීම නොකෙරේ. එහෙත් නීතිය උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් ක්‍රියාත්මකවන නියමානුකූල ක්‍රියාදාමයන්ට අනුව අධිකරණ ක්‍රියාවලිය හරහා සිදුකරන විමර්ශන සඳහා අපි බැඳී සිටිමු.

**ගෞරවනීය නියෝජිතයිනි,**

❖ එක්සත් ජාතීන්ගේ විශේෂ පරිපාටීන් මෙන්ම ගිවිසුම් ආයතන සමඟ ශ්‍රී ලංකාව තම සබඳතාව හා සහයෝගිතාව ශක්තිමත් කොට ඇත.

උදාහරණයක් ලෙස, පසුගිය විශ්ව කාලාන්තර සමාලෝචනයේ පටන් ශ්‍රී ලංකාව ගිවිසුම් ආයතන සමාලෝචන 6කට සහභාගී වී ඇති අතර ළමා අයිතිවාසිකම් සම්බන්ධ සම්මුතියේ සමාලෝචනය 2018 ජනවාරි මාසයේ දී සිදුකිරීමට නියමිතය.

මෙම ක්‍රියාවලීන් සඳහා රජයේ පැහැදිලි කැපකිරීම පෙන්වමින්, මෙම සමාලෝචනවලින් බොහෝමයක් 2016 සහ 2017 යන වසරවල දී කරන ලදී. වාර්තා සැපයීමට අප සතු වගකීම් යළි පැහැර නොහැරීමට අපි අදිටන් කරගෙන සිටිමු. මෙම කාර්යය සඳහා අභ්‍යන්තර ක්‍රමවේදය ශක්තිමත් කිරීමට මෙන්ම ගිවිසුම් ආයතන, විශේෂ පරිපාටීන් හා විශ්ව කාලාන්තර සමාලෝචනය පිළිබඳව නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඵලදායි ව විභාග කිරීම හා පසු විපරම් කිරීමට සුදුසු ආකාරයන් පිළිබඳව දැනට අපි සාකච්ඡා කරමින් සිටිමු.

මෙම කාර්යය සඳහා අභ්‍යන්තරික ක්‍රියාවලින් පිහිටුවේ හා ශක්තිමත් කිරීමේ ක්‍රියාවලියේ දී අප එක්සත් ජාතීන්ගේ මෙරට කාර්යාලය සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය මෙන්ම 'UPR info' සේවාව සමගද කටයුතු කරන්නෙමු. මේ ව්‍යායාමයන් අප කරනුයේ සිවිල් සමාජයේ ද සහයෝගය ඇතිවය.

❖ 2015 දෙසැම්බර් මාසයේ දී, සියලුම තේමාගත විශේෂ පරිපාටීන් වෙත ශ්‍රී ලංකාව ස්ථාවර ඇරයුමක් කළේය.
❖ පසුගිය විශ්ව කාලාන්තර සමාලෝචනයේ සිට තේමාගත විශේෂ පරිපාටි නියෝගධාරීන් හා කෘත්‍යාධිකාරී කණ්ඩායම් අටක් ශ්‍රී ලංකාවේ සංචාරය කර ඇති අතර ඒ අතරින් 6ක් මෙරටට පැමිණියේ 2015 ජනවාරි මාසයේ සිට ගත වූ පසුගිය වසර දෙක තුළය.
❖ තවද, මෙම වසරේ දෙසැම්බර් මස සිට 415 දක්වා කාලය තුළ අත්තනෝමතික රඳවා තබාගැනීම් සම්බන්ධයෙන් වන කෘත්‍යාධිකාරී කණ්ඩායම මෙරට සංචාරයක නිරත වීමට නියමිත අතර, මත දැරීමේ සහ ප්‍රකාශන නිදහසේ අයිතිය ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සම්බන්ධ විශේෂ වාර්තාකරු ලබන වසර මුලදී සංචාරය කිරීමට නියමිතය.

**මෙවන් කෙටි කාල පරාසයක් ඇතුළත, වෙනත් කිසියම් රටකට මෙතරම් විශේෂ පරිපාටීන් සංඛ්‍යාවක් කිසි කලෙක පැමිණ ඇත්දැයි යන්න ගැන අපි සැබැවින්ම විමතියට පත්වන්නෙමු.**

මීට අමතරව, පිළිවෙලින් 2013 වර්ෂයේ දී හා 2016 පෙබරවාරි මාසයේ දී එවක සිටි සහ වර්තමාන මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරුන් ශ්‍රී ලංකාවේ සංචාරය කළ අතර එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා 2016 සැප්තැම්බර් මාසයේ දී මෙරට සංචාරය කළේය.

❖ විමසුම් කාල සීමාව තුළදී, ජාත්‍යන්තර නෛතික ලේඛන රාශියක ශ්‍රී ලංකාව රාජ්‍ය පාර්ශවයක් බවට පත්විය. ඒවා අතර,

- 2015 පෙබරවාරි මාසයේ දී ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධ ජාත්‍යන්තර සම්මුතියට එක්වීම, 2015 ජුනි මාසයේ දී කාන්තා හා ළමා ජාවාරම වැළැක්වීම සම්බන්ධයෙන් වූ පලෙර්මෝ සන්ධානයට එක්වීම.
- 2016 මැයි මාසයේ දී, බලහත්කාරයෙන් අතුරුදන් කිරීමෙන් සෑම පුද්ගලයෙකුම ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියට එක්වීම

- 2016 සැප්තැම්බර් මාසයේ දී අන්ධ, දෘශ්‍යාබාධිත හෝ අක්ෂර කියවීමේ ආබාධ සහිත පුද්ගලයන් සඳහා ප්‍රකාශයට පත් කළ වැඩ කටයුතු සඳහා පහසුකම් ලබාගැනීම සඳහා වූ මර්කේෂ් ගිවිසුමට එක්වීම සහ
- 2016 සැප්තැම්බර් මාසයේ දී දේශගුණික විපර්යාස සම්බන්ධ පැරිස් ගිවිසුමට අත්සන් තැබීමට වේ.

- ❖ ඊයේ දින, එනම් නොවැම්බර් මස 14 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් වධ හිංසාව සහ අනෙකුත් කුරිරු, අමානුෂීය හෝ පහත් ආකාරයෙන් සැලකීම හෝ දඬුවම් කිරීම පිටු දැකීමේ සම්මුතිය සඳහා වූ වෛකල්පිත සන්ධානය වෙත ශ්‍රී ලංකාවේ ප්‍රවේශය අනුමත කළ බව මා අද දැනුම් දෙන්නේ ඉමහත් සතුටිනි. වෛකල්පිත සන්ධානය ප්‍රකාරව ජාතික නිවාරණ යාන්ත්‍රණයක් ලෙස ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම පත් කිරීමට නියමිතය. වද හිංසාවලට එරෙහිව පලදායි ලෙස සටන් කිරීමේ හා වැළැක්වීමේ අපගේ දැඩි අරමුණු තව දුරටත් ශක්තිමත් කිරීමට උපකාරී වන වැදගත් පියවරක් ලෙස අපි මෙය දකින්නෙමු.
- ❖ සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් වූ සම්මුතියේ 29 වැනි වගන්තිය සම්බන්ධයෙන් ඉදිරපත් කර තිබූ විශේෂ කොන්දේසි ශ්‍රී ලංකාව නිල වශයෙන්ඉල්ලා අස්කර ගත් අතර 2016 අගෝස්තු 16 වැනි දින එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා මේ සම්බන්ධයෙන් දැන්වීමක් ප්‍රසිද්ධියට පත් කළේය.
- ❖ 2015 නොවැම්බර් මාසයේ සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) යටතේ ප්‍රකාශයට පත්කරන ලද කීර්තිනාම බාල කිරීම් ශ්‍රී ලංකාව විසින් ඉල්ලා අස්කර ගන්නා ලදී.
- ❖ තනි පුද්ගලයන් විසින් එවනු ලබන සන්නිවේදන ප්‍රතිග්‍රහණය කිරීමට වධ හිංසා පිටු දැකීමේ සම්මුතියේ 22 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයක් සිදු කරන ලදී.

**4.සිවිල්, දේශපාලනික, ආර්ථික, සමාජීය, සංස්කෘතික, අයිතිවාසිකම් ආශ්‍රිත සන්ධිස්ථාන.**

**උප සභාපතිතුමනි,**

- ❖ මම මෙතැන් සිට සිවිල්, දේශපාලනික, ආර්ථික, සමාජීය, සංස්කෘතික, අයිතිවාසිකම් තව දුරටත් නඟා සිටුවීම ආශ්‍රිතව ළඟා කරගත් ජයගහන පිළිබඳ අවධානය යොමු කරන්නෙමි.
- ❖ 2015 මැයි මස දී 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුව විසින් බලාත්මක කරන ලදි.
- ❖ මෙම සුවිශේෂී සංශෝධන විධායක ජනාධිපති ධූරයේ බලතල සීමා කිරීමටත්, රාජ්‍ය සේවයේ දේශපාලනීකරණය තුරන් කිරීමේ පරමාර්ථය සහිතව ප්‍රධාන රාජ්‍ය ආයතනයන් හි නිදහස ශක්තිමත් කිරීමටත් සමත් විය.
- ❖ මැතිවරණ කොමිසම, නීති සේවා කොමිසම, රාජ්‍ය සේවා කොමිසම, ජාතික පොලිස් කොමිසම, මුදල් කොමිසම, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම, අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිසම, යනාදී ස්වාධීන කොමිසම් සඳහා වන පත් කිරීම් සිදු කිරීමට විධායක ජනාධිපතිවරයා සතුව ඇති බලතල මේ වන විට 19 ව්‍යවස්ථා සංශෝධනය හරහා ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතියට යටත්ව ඇත.
- ❖ පාර්ලිමේන්තුවේ ආණ්ඩු හා විපක්ෂ නියෝජිතයන් මෙන් ම දේශපාලන මැදිහත්භාවයන්ගෙන් තොර නිදහස් මතධාරීන් ද ව්‍යවස්ථාදායක සභාවට ඇතුළත් ය.

- 19 වැනි සංශෝධනය මගින් එතෙක් කලක් 6 වසරක් වූ ජනාධිපති ධූර කාලය වසර 5ක් දක්වා අඩු කරන ලදී.
- විධායක ජනාධිපති ධූරය වාර දෙකක් දක්වා සීමා කිරීම ප්‍රතිස්ථාපනය කරන ලදී.
- පර්ලිමේන්තුවේ ධූර කාලය 6 වසරක සිට 5 වසරක් දක්වා අඩු කරන ලදී: එසේම පර්ලිමේන්තුව විසුරුව හැරීමට ජනාධිපතිවරයා සතු වූ බලතල අහෝසි කරන ලද අතර, තුනෙන් දෙකක බහුතර යෝජනාවකින් තොරව වසර 4 1/2ක් යනතෙක් පර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය ජනාධිපතිවරයාට නොමැත්තේ ය.
- නිශ්චිත ජනාධිපති හා පාර්ලිමේන්තු ධූර කාල සීමා ස්ථාපනය කිරීම හරහා බලය විමධ්‍යගත කිරීමේ බලතල ශක්තිමත් කිරීමට ද, ව්‍යවස්ථාව හරහා ඇති කරන ලද ආයතනයන් හි ස්වාධීනත්වය නිදහස ප්‍රතිස්ථාපනය කිරීමට ද, විධායක ජනාධිපති ධූරයට පර්ලිමේන්තුව හැසිරවිය හැකි බලය අවම කිරීමට ද මෙම විධිවිධාන හරහා හැකි වේ.
- 19 වැනි සංශෝධනය බලාත්මක කිරීම හරහා **ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ** ස්වාධීනත්වය ශක්තිමත් කරන ලදී.
- මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් හෝ ඊට ආසන්න අවස්ථාවන් විමර්ශනය කිරීමට, ව්‍යස්ථාදායකය නිර්මාණයේ දී රජයට උපදෙස් ලබා දීමට, ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල ව දේශීය නීතිය පවත්වාගෙන යාම සඳහා නිර්දේශ ලබා දීමට, මානව හිමිකම් ගිවිසුම්වලට එළඹීම හෝ දායකවීම සඳහා නිර්දේශ සැපයීමට කොමිසම සවිබල ගන්වා තිබේ..
- පූර්ව/ඡායා වාර්තා ඉදිරිපත් කිරීම හරහා කොමිසම මෑත කාලීන ගිවිසුම් රාමු සමාලෝචනයන් ආශ්‍රිතව කැපී පෙනෙන කාර්ය භාරයක් ඉටු කර ඇති අතර විශ්ව කාලාන්තර සමාලෝචන සැසිවාරය වෙනුවෙන්, කොමිසම ලබාදුන් දායකත්වය අපි අගය කරමු. ලබන වසර සඳහා කොමිසන් සභාව වෙනුවෙන් වෙන් කර ඇති මූල්‍යමය ප්‍රතිපාදන ඉහළ නැංවීමට රජය ක්‍රියා කර ඇත.
- **අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන්ට ආධාරදීම හා ඔවුන් ආරක්ෂා කිරීම සඳහා වූ පනත** 2015 පෙබරවාරි මස දී පාර්ලිමේන්තුව මගින් ඒකමතිකව සම්මත කරගැනීම සහ ඉන් අනතුරුව නීතිය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම, එක් අතෙකින් අපරාධ වින්දිතයන්ගේ සහ අනෙක් අතට සැකකරුවන් හා විත්තිකරුවන් වෙනුවෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් අතර තුළනයක් ඇති කරන සුවිශේෂී අවස්ථාවකි.
- අපරාධ යුක්තිය පසිඳලන ක්‍රමයේ ප්‍රමුඛ වෙනසක් ඇති කිරීමට මෙම පනතට හැකියාව ලැබී ඇත. අපරාධ වින්දිතයන්ගේ හා විත්තිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් පෙන්වා දීමට මෙම පනත ක්‍රියා කරයි.
- ඒ හරහා අපරාධ වින්දිතයන් වෙනුවෙන් වන්දි මුදලක් ප්‍රදානය කිරීමට ක්‍රියා කරන අතර, ඒ වෙනුවෙන් විශේෂ අරමුදලක් නිර්මාණය කර ඇත.
- 2016 ජනවාරි 08 වැනි දින ජනාධිපතිවරයාගේ මූලිකත්වයෙන් මෙම පනතට යටත් ව ජාතික අධිකාරියක් නිර්මාණය කරන ලදී. මේ වෙනුවෙන් 2018 වසර සඳහා වූ අයවැය හරහා වැඩි මුදලක් වෙන්කර ඇත.
- විත්තිකරුවන් හා වින්දිතයන් ආරක්ෂා කිරීමට හා ඔවුන්ට විරුද්ධ ව සිදුවිය හැකි වරදවල් සම්බන්ධයෙන් සොයා බැලීමට ශ්‍රී ලංකා පොලිසියේ විත්තිකරුවන් ආරක්ෂා කිරීමේ අංශය පොලිස්පතිවරයා විසින් ස්ථාපනය කරන ලදී.

- ❖ පුද්ගලික වශයෙන් අධිකරණය ඉදිරියේ පෙනී සිටීමකින් තොර ව, ශ්‍රී ලංකාවෙන් පිටත ඕනෑම ස්ථානයක දී සාක්ෂි වාර්තා කර ගැනීමට හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයෙන් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට මෙන්ම එවන් කාර්යයන් සඳහා විදේශයන් හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා පහසුකම් සැලසීමට හැකිවන පරිදි මෙම පනතට සංශෝධනයක් නොවැම්බර් 07 වැනි දින, පාර්ලිමේන්තුව මගින් සම්මත කර ගන්නා ලදී.
- ❖ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනයට අනුව තොරතුරු දැනගැනීමට ඇති අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස හඳුනාගැනීමෙන් අනතුරුව, **තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත (RTI)** බලාත්මක කරන ලදී.

- 2017 පෙබරවාරි 03 වැනි දින සිට මෙම පනත බලාත්මක විය.
- රාජ්‍ය ආයතනයන් හි විනිවිදභාවය හා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ සංස්කෘතියක් නඟා සිටුවීමට මෙන් ම වංචාව නවතා දැමීමට මේ හරහා අපේක්ෂිතය.
- පොදු ජනතාවට තොරතුරු දනගැනීමට ඇති අයිතිය ළඟා කර දෙමින්, සමාජ ජීවිත තුළට සම්පූර්ණයෙන් ම අන්තර්ග්‍රහණය විය හැකි පුරවැසියන් සහිත සමාජයක් බිහි කරලීම අපගේ අපේක්ෂාවයි.
- පනත ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා නිර්මිත තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිසම ක්‍රියාත්මක වන අතර විවිධ රාජ්‍ය ආයතන ආශ්‍රිතව තොරතුරු සම්පාදනය කරලීමට යෝජනා ඉදිරිපත් කරමින්, පොදු මහජනයා මෙහි වාසි ලබා ගැනීමට සමත්ව ඇත.

- ❖ **කාන්තාවන් හා දරුවන්** මුහුණදෙන ගැටලු පිළිබඳ ව අවධානය යොමු කිරීමේ වැදගත්කම සලකා බලමින් මේ සම්බන්ධයෙන් මූලිකත්වය ලබා දී කටයුතු කිරීමට රජය ක්‍රියා කරමින් සිටී.

- ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් හිංසනයට පිළියම් යෙදීම පිණිසද පියනවර ගෙන ඇත.
- විවිධ පුදගලයන්ට වෙනස් ලෙස සලකන නීති සහ ව්‍යවහාරයන්ට අදාල නීති ප්‍රතිසංස්කරණයකිරීම සහ එවැනි වෙනස්කම් ජනිත කරවන පුද්ගල නීති සංශෝධනය කිරීම ද, ඉටු කිරමට අපේක්ෂිත කාර්යයන් අතර වේ. ඒ සම්බන්ධ සාකච්ඡා සහ අදහස් විමසීම් දැනට කෙරෙමින් පවතී.
- ළමා අයිතිවාසිකම් පූර්ණ ලෙස භුක්ති විඳීම තහවුරු කරමින් ළමා ශ්‍රමය භාවිතය තුරන් කිරීමට රෙගුලාසි හා ක්‍රියාමාර්ග නිර්මාණය කර ඇත. 2016 ජනවාරි මස සිට ජනාධිපතිවරයාගේ මඟපෙන්වීම යටතේ ළමා ආරක්ෂාව වෙනුවෙන් විශේෂ ජනාධිපති කාර්ය බලකායක් ක්‍රියාත්මක වේ. 2016 ජූනි මස දී, රජයේ ඉහළ ම කැපවීම පෙන්නුම් කරමින් ළමා හිංසනය පිටුදැකීමේ දිනයේ දී **ළමා හිංසනය සහමුලින් ම පිටු දකින** බවට ජනාධිපතිවරයා ශපථ කළේය.

- ❖ ශ්‍රී ලංකාව තුළ අභ්‍යන්තරිකව අවතැන් වූ ජනතාවගේ ශුභ සාධනය සහ ජීවනෝපාය සහාය වෙනුවෙන් රජය විශේෂ අවධානය යොමු කර තිබේ. 2009 වසරේ යුද්ධය අවසානය වනවිට අභ්‍යන්තරික වශයෙන් අවතැන් වූ පිරිස ලක්ෂ 3 ඉක්ම වීය.අද වනවිට යාපනයේ ශුභ සාධන කඳවුරුවල වෙසෙන්නේ පවුල් 765කට අයත් පුද්ගලයින් 3000කටත් අඩු ප්‍රමාණයකි. රජය අභ්‍යන්තරික වශයෙන් අවතැන් වූවන් සඳහා ස්ථිරසාර විසැඳුම් සෙවීමේ නිරන්තර උත්සාහයක යෙදී සිටී. 2016 අගොස්තු මස ගැටුම් බල පෑ ප්‍රදේශවල වෙසෙන්නන් ද ඇතුළුව ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ මතය විමසමින් පිළියෙල කරන ලද ගැටුම් හේතුවෙන් සිදු වූ අවතැන්වීම් සඳහා කල්පවත්නා විසඳුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය " අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිණි.

❖ තිරසර සංවර්ධන ප්‍රතිපත්තීන් සමඟ සංයෝජිත යහපත් ආර්ථිකයක්, අපගේ ජනතාවගේ අයිතීන් සහතික කිරීමට කේන්ද්‍රීය වේ. මානව හිමිකම් ආරක්ෂණය හා ප්‍රවර්ධනය සහ විශේෂයෙන් ම අප අපේක්ෂා කරන තිරසාර සාමය, සංහිඳියාව හා ගැටුම් නැවත ඇති නොවීම යන කාරණාවල දිගු කාලීන පැවැත්ම සඳහා ආර්ථික වර්ධනය සහ ජනතාවගේ අභිලාෂයන් මුසු වූ සමානාත්මතාවයෙන් යුතු සියල්ල ඇතුළත් සංවර්ධනය අත්‍යවශ්‍ය වේ.

- පසුගිය සතියේ නොවැම්බර් 7 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබූ 2018 වර්ෂය සඳහා වූ අයවැය තිරසර සංවර්ධන ඉලක්ක මූලධර්මයන් මත පදනම් ව පිළියෙළ කරන ලද අතර එය "නීල හරිත අයවැය: එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" යන තේමාවෙන් යුතු විය. ශ්‍රී ලංකාව ආකර්ශනීය වෙළඳ කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම සියලු ශ්‍රී ලාංකිකයන් සෞභාග්‍යමත් රටක පාර්ශ්වකරුවන් බවට පත් කිරීමට දිරි ගැන්වීමට හැකි වන සේ ව්‍යවසායකත්ව ආකල්පයන් යළි ප්‍රබෝධමත් කිරීම මෙමගින් අපේක්ෂිතයි.

- නීල හරිත ආර්ථිකයක් සහ සංවර්ධන ක්‍රමෝපායක් අනුගමනය කිරීම අනුකූල වන්නේ, පැරිස් ගිවිසුම කෙරෙහි හෝ 2030 වර්ෂය සඳහා වූ සංවර්ධන න්‍යාය පත්‍රය කෙරෙහි වන අපගේ කැපවීම සමග පමණක් නොවේ. ඒ වනාහි අප අපටමත් අපගේ ඉදිරි පරම්පරා වෙනුවෙනුත් ඉටුකරන යුතුකමකි. එය අප රට සඳහා පමණක් නොව අන්තර් ජාතික ප්‍රජාවේ වගකිව යුතු සාමාජිකයෙකු වශයෙන් අප සියලු දෙන නිවහන ලෙස හඳුන්වන මිහිතලයේ වාසීන් ලෙසත් ඉටු කරන යුතු කමකි.

- අපිට 4.5% ක ස්ථාවර දළ දේශීය නිෂ්පාදන වර්ධන වේගයක් පවත්වා ගැනීමට හැකියාව ලැබුණු අතර එය 2018 වර්ෂයේ දී 5% දක්වා වර්ධනය කර ගැනීමට අපේක්ෂිතය.

- අපි 2030 වර්ෂය සඳහා වන සංවර්ධණ න්‍යාය පත්‍රයෙහි එන සංවර්ධන ඉලක්ක 17, රජයේ ජාතික ප්‍රතිපත්ති හා වැඩසටහන් තුළට ඇතුළත් කරමින් ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරමින් සිටින්නෙමු.

- 2017 ඔක්තෝබර් මස පාර්ලිමේන්තුවේ දී සම්මත කෙරුණු "ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන පනත", එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය අනුගමනය කිරීමට රජය දෙන ලද ප්‍රතිඥාව සුරැකීමෙහි ලා ගනු ලැබූ ඉදිරි පියවරකි. මෙම ක්‍රියාවලිය පහසු කිරීම සඳහා මෙතෙක් නීති සම්පාදනය කළ රටවල් කිහිපය අතුරින් ශ්‍රී ලංකාව එක් රටක් බව අපගේ දැන ගැනීමයි.

- මෙම පනත රටෙහි ජාතික අභිලාෂයන් සමඟ රටට අවශ්‍ය ජාතික ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සකස් කිරීමට විධිවිධාන සපයනු ලැබුව ද තිරසර සංවර්ධන ඉලක්ක 17 න් මග පෙන්වීම ලබා තිබේ.

❖ භාෂා සහ සංස්කෘතික අයිතීන් ගැන කථා කරන විට ජාතික ගීය දෙමළ භාෂාවෙන් ගායනා කිරීම සඳහා කිසිම තහනමක් නොපවතින බව සඳහන් කරමින් රජය 2015 මාර්තු මස සියලු රාජ්‍ය ආයතන වෙත චක්‍රලේඛයක් නිකුත් කළ බව සඳහන් කරනු වටී. වසර 68කට පසු ප්‍රථම වරට ජාතික ගීය සිංහල හා දෙමළ යන නිල භාෂා දෙකෙන් ම 2016 පෙබරවාරි මස 4 වැනි දින ජාතික නිදහස් දින සමරු උළෙලේ දී ගායනා කරනු ලැබිණි.මෙම සම්ප්‍රදාය අනෙකුත් අවස්ථාවල දී ක්‍රියාත්මක කෙරෙයි.

- උතුරු හා නැගෙනහිර පළාත්වල නීතිය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයන්ට ප්‍රවිශ්ටවීමේ දී ජනතාව භාෂාමය වශයෙන් මුහුණ දෙන බාධක හඳුනා ගනිමින් දෙමළ බස කථා කරන පොලිස් නිළධාරීන්

216 දෙනෙකු , පොලිස් නිලධාරිණියන් 26 දෙනෙකු සහ උප පොළිස් පරීක්ෂකවරුන් 14 දෙනෙකු ද බඳවා ගනු ලැබිණි.

❖ ප්‍රතිසංස්කරණ තිරසාර වීම සඳහා පහළ සිට ඉහළට කෙරෙන ප්‍රවේශයන් අත්‍යවශ්‍ය බව රජය තරයේ විශ්වාස කරන බැවින් ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම (NHRAP) හා විශ්ව කාලාන්තර සමාලෝචනය (UPR) සඳහා වූ ජාතික වාර්තාව යන සියල්ල සකස් කරනු ලැබුවේ පෙර සඳහන් කළ පරිදි මහජන මත විමසීමකින් අනතුරුවය.

- කීර්තිමත් සිවිල් සමාජ නියෝජිතයින් එකොළොස් දෙනෙකුගෙන් සමන්විත ප්‍රචාරණ කාර්ය බලකාය සංහිඳියා යාන්ත්‍රණය පිළිබඳ ප්‍රචාරණ දිවයින පුරා පවත්වන්නට යෙදුණි. මෙම ක්‍රියාවලිය තුළින් ලබාගත් යෙදවුම් සත්‍යය සෙවීමේ කොමිසම හා වන්දි කාර්යාලය මූලිකව නිර්මාණය කිරීමට හා එහි පැවැත්මට භාවිතා කරන ලද අතර සංහිඳියා ක්‍රියාදාමයට සම්බන්ධ වෙනත් කටයුතු සඳහා නිරන්තරයෙන් භාවිතා කරමින් සිටී. ප්‍රචාරණ කාර්ය බලකා සාමාජිකයින් සහ කලාප කාර්ය බලකා සාමාජිකයින් සමඟ විධිමත් උපදේශනයන් සංහිඳියා සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය හරහා අඛණ්ඩ ව සිදු කෙරේ.

- උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම වැනි ජනාධිපති කොමිසම්, 1990 ගණන්වල දී පිහිටුවන ලද පුද්ගලයින් අකමැත්තෙන් ඉවත් කිරීම හෝ අතහැර දැමීම පිළිබඳ ජනාධිපති විමර්ශන කොමිසම, පරණගම කොමිසම ලෙස හඳුන්වන අතුරුදන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමට පත්කළ ජනාධිපති කොමිසම ආදී පෙර පැවති ක්‍රියාදාමවල වාර්තා මෙන්ම එක්සත් ජාතීන්ගේ වාර්තා, මෙරට සහ පාර සමුද්‍රීය එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, පුද්ගලයින්,සහ මානව හිමිකම් සංවිධාන මගින් නිර්මාණය කරන ලද වාර්තා හා දත්ත ද සංහිඳියා යාන්ත්‍රණ විසින් භාවිතා කරනු ඇත.

- ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් ද පුළුල් මහජන මත විමසීමේ එම ක්‍රියාදාමය වෙනුවෙන් පිහිටුවන ලද මහජන නියෝජන කොමිසම විසින් සිදු කරනු ලැබිණි. ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය ගැටුම් නැවත ඇති නොවීමට වගවීමේ පියවරක් වශයෙන් ප්‍රමුඛ කොට සලකන ලදී. පාර්ලිමේන්තු මැතිවරණයෙන් අනතුරුව සම්මුතිවාදී රජයේ පළමු සංවත්සරය සැමරීම වෙනුවෙන් ව්‍යවස්ථාදායක සභාව පිහිටු වීමට රාමුගත යෝජනාවක් සම්මත කර ගැනීමට සඳහා අදාළ කටයුතු ආරම්භ කිරීමට සහ ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියේ කටයුතු ආරම්භ කිරීමට 2016 ජනවාරි මස 9 වැනි දින පාර්ලිමේන්තුවේ විශේෂ සභා වාරයක් කැඳවනු ලැබීය. එකී යෝජනාව මාර්තු මාසයේ දී ඒකමතික ව සම්මත කෙරිණි. මූලික අයිතිවාසිකම්,අධිකරණය,නීතිය හා සාමය,මහජන මුදල්, රාජ්‍ය සේවය සහ මධ්‍ය පර්යන්ත සබඳතා යන විශේෂ තේමාත්මක ගැටලු සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට පාලන කමිටුවක් සහ උප කමිටු 6ක් පත් කරනු ලැබිණි. මෙම වර්ෂයේ සැප්තැම්බර් මස 21 වැනි දා පාලන කමිටුවේ අතුරු වාර්තාව අගමැතිතුමා විසින් ව්‍යවස්ථාදායක සභාවට ඉදිරිපත් කරනු ලැබුණු අතර එය ඔක්තෝබර් මස 30 වන දින සිට නොවැම්බර් 3 දක්වා දින 5ක් ව්‍යවස්ථාදායක සභාවේ දී විවාදයට ලක් කෙරිණි. පාලන කමිටුවේ අවසන් වාර්තාව ඉදිරිපත් කිරීමට මත්තෙන් වැඩිදුර උපදේශනයන් අඛණ්ඩව සිදු වේ. නව ව්‍යවස්ථාව සම්මත කරනු පිණිස පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරය සහ ජනමත විචාරණයක දී ජනතාව ලබා දෙන අනුමැතිය අවශ්‍ය වේ.

## 5. 30/1 සහ 34/1 යෝජනා සම්මුතීන් හා සංහිඳියාව ක්‍රියාත්මකකරණය

**උප සභාපතිතුමනි**

- ❖ 30/1 සහ 34/1 යෝජනා සම්මුතීන් වල පොරොන්දු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කලින් ඉදිරිපත් කළ ප්‍රශ්න කිහිපයකට ප්‍රතිචාර දක්වමින්, එම යෝජනා සම්මුතීන් ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම සඳහා අපගේ ස්ථිරසාර බැඳීම නැවත තහවුරු කිරීමට කැමැත්තෙමු. ඔබ සැම දෙනා ඇතුළත්ව එම අරමුණ උදෙසා අඛණ්ඩව හා ක්‍රමානුකූලව වැඩ කරන්නෙමු.

- මෙම වසරේ සැප්තැම්බර් මස 15 වන දින ක්‍රියාකාරිත්වයට පත්වූ අතුරුදන්වූ පුද්ගලයන් සම්බන්ධ කාර්යාලය, පසුගිය සතියේ පාර්ලිමේන්තුවට ඉදිරිපත්වූ 2018 වර්ෂයේ අපගේ අයවැයෙන් එම කාර්යාල පිහිටුවීම සඳහා වෙන්කළ යෝජිත රුපියල් බිලියන 1.4 කින් පිහිටුවන පළමු සංහිඳියා යාන්ත්‍රණයයි.

**ගෞරවනීය නියෝජිතයනි,**

- අප ඉතිහාසයේ පළමු වතාවට, 2018 වර්ෂයේ ජාතික අයවැයෙන් කොටසක් විශේෂයෙන්ම සංහිඳියාව සඳහා වෙන් කෙරිණි. සංහිඳියාව හා සාමය සඳහා කළ ආයෝජන මගින් ආරක්ෂාව හා ස්ථාවරත්වය ශක්තිමත් වන බැවින් ද ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා සාරවත් පරිසරයක් නිර්මාණය වන බැවින්ද එම ආයෝජන වඩාත් සුදුසු ආර්ථික ප්‍රතිපත්තියක් ලෙස අපි සලකමු. එමෙන්ම ආදායම් වර්ධනය හා සේවා නියුක්තිය ශක්තිමත් කරන ආර්ථික ප්‍රතිපත්තියක් දිගුකාලීන සාමය, ආරක්ෂාව, ස්ථාවරත්වය සහ සංහිඳියාව සඳහා අවශ්‍ය තත්වයන් ගොඩනැගීමට අපට උපකාරී වෙයි.

## 6. වැදගත් කරුණු සහ අභියෝග

**උප සභාපතිතුමනි,**

- ❖ 2015 වර්ෂයේදී ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වූ දින සිට, කෙටි කාල සීමාවක් ඇතුළත අපගේ මානව හිමිකම් පොරොන්දු සම්බන්ධයෙන් අප ළඟා කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳ තොරතුරු, මෙම කෘත්‍යාධිකාරී කණ්ඩායම සමඟ බෙදා හදා ගැනීමේදී අප විසින් විවෘත හා විනිවිදභාවයෙන් යුක්තව කටයුතු කර ඇත.

- ❖ අපගේ දැක්ම දිගුකාලීනය. අප විසින් ළඟා කරගෙන ඇති වෙනස්කම් හා ප්‍රගතිය අප ජාතියේ ආයතන හා ව්‍යුහයන් තුළ ස්ථිරව ආරක්ෂාවන බවටත්, වඩාත් ඉහළ දැනුවත්භාවයකින් හා අවබෝධයකින් සිය අයිතීන් ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලි තුළ අපගේ මහජනතාව සම්බන්ධවී සිටින බවටත් තහවුරු කිරීම දැකබලා ගැනීමට අපට අවශ්‍යය. එවන් ස්ථිරසාර වෙනසක් කෙරෙහි අපි විශ්වාසය තබන්නෙමු.

අපට වැදගත් කරුණු හා අප ඉදිරියේ ඇති අභියෝග කිහිපයක් මෙහිලා දැක්වීමට කැමැත්තෙමු.

- ශ්‍රී ලංකාව විසින් බොහෝ දේ අත්පත් කරගෙන ඇත. එහෙත් අපි එය තෘප්තිමත් වීමට හේතුවක් ලෙස නොසලකමු. සමහරුන් චෝදනා කරන ලෙස අප මානව හිමිකම් පිළිබඳව උදාසීනව හෝ නොසලකා සිටින්නේ හෝ නැත. අපගේ සැම පුරවැසියකුම ඔවුන්ට හිමි

අයිතීන් පූර්ණ වශයෙන් භුක්ති විඳීම පිළිබඳව සහතික වීම සඳහා තවත් බොහෝ දේ කළ යුතුව ඇති බව අපි හොඳාකාරව දනිමු. සිය පුද්ගලානුබද්ධ අයිතීන් විසින් සවිබල ගන්වනු ලැබූ පුරවැසියන් අපගේ ජාතිය ශක්තිමත් කරන බව අපි තරයේ විශ්වාස කරමු.

- පසුගිය මාස 35 මුළුල්ලේ අප ලබා ගත් ජයග්‍රහණ දෙස,

  - පරිපාලනමය, ආයතනමය, ව්‍යවස්ථාමය,නෛතික, ආර්ථික මෙන්ම මානව හිමිකම් ඇතුළු ප්‍රතිසංස්කරණ තුළින් ගැටුම් නැවත ඇති නොවීමට වගබලා ගැනීම.

  - දකුණේ ඇති වූ තරුණ කැරලි දෙකකට හේතුව, විවිධ අයුරින් සහ විවිධ කාල වලදී සෑම ප්‍රජාවකටම බලපෑම් එල්ල කළ දීර්ඝ කාලයක් පුරා පැවැති ප්‍රචණ්ඩත්වය සහ නොසලකා හැරීම් හමුවේ ප්‍රජාවන් අතර පවතින අවිශ්වාසය දුරලමින් රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් දිය වී ගිය විශ්වාසය යළි ගොඩනැගීම; සහ

  - සෑම මට්ටමකදීම ආයතන ක්‍රියාත්මකවීම සඳහා යහපාලනය විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව යන කාරණාවල ප්‍රමිතීන් සහ ප්‍රතිමාන ප්‍රතිෂ්ඨාපනය කිරීම;

යන ඉලක්ක ළඟාකර ගැනීම උදෙසා දැඩිලෙස කැපවුණු, සංවර්ධනය වෙමින් පවතින ජාතියක් වශයෙන් ලබා ගත් ජයග්‍රහණ යන සන්දර්භයෙහි තබා බැලිය යුතු බව අපගේ අදහසයි.

- අවාසනාවකට මෙන්, ජාතිය සමගි කිරීමට සහ දුෂ්කර අතීත උරුමයක් පිළිගැනීමට ගන්නා ලද සෑම පියවරක්ම විවාදයට තුඩු දී ඇත. විවිධ ජාතීන් හා ආගම්වලින් සමන්විත ප්‍රජාවන් අතර සාමකාමී සබඳතා තහවුරු කිරීමටත්, ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ ගෙන ඒමටත් අප දරන ප්‍රයත්න සහ දක්වන කැපවීම්, බෙදීම් ඇති කිරීමේ උත්සාහයක් ලෙසට විරුද්ධවාදීහු නිරන්තරව තර්ක කරති. එනමුත් දැඩි අධිෂ්ඨානයෙන් යුතුව අපි නොසැලී කටයුතු කරමු.
- ප්‍රජාතන්ත්‍රවාදී රටක් වශයෙන්, මානව හිමිකම්, තිරසාර සාමය සහ සංහිඳියාව පරිපූර්ණ වශයෙන් භුක්ති විඳීම උදෙසා වූ අපගේ ගමන පිළිබඳව දැඩි විවේචන සහ මතවාද අපි අපේක්ෂා කරමු. එනමුත් වෙනත් බොහෝමයක් ප්‍රජාතන්ත්‍රවාදී රටවල මෙන් පොදු පිළිගැනීම, යම්තාක් දුරකට සාවද්‍ය තොරතුරු, මෙහෙයවීම් සහ අගතියෙන් යුක්ත වන බව අපි දනිමු. මානව හිමිකම් ආරක්ෂා කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ මෙන්ම සංහිඳියාව වැඩිදියුණු කිරීමේ වටිනාකම සම්බන්ධයෙන් ජාතික එකඟතාවක් ගොඩනැගීමේ සහ එය පවත්වා ගැනීමේ අරමුණෙන් ප්‍රවේශම් සහගත විචක්ෂණශීලී ගමනක් යායුතු බව අප විශ්වාස කරන්නේ මෙම හේතූන් මතය. ජාතියක් වශයෙන් අපි වසර ගණනාවක් කෝලාහලවලට මැදිව ගත කළෙමු. රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ ද්විත්වය එක්ව කටයුතු කරන මෙවන් ඓතිහාසික අවස්ථාවක අප ආරම්භ කිරීමට අපේක්ෂා කරන ප්‍රතිසංස්කරණ, කල් පවත්නා ඒවා බවට තහවුරු කෙරෙන පියවර අනුගමනය කිරීමට අප සුපරීක්ෂාකාරී වන බව සනාථ කිරීම අත්‍යවශ්‍ය වේ.

## 7. සමාප්තිය

- උප සභාපති තුමනි, අවසාන වශයෙන්, සියලුම සිවිල් සමාජයීය කණ්ඩායම් හා නියෝජිතවරුන් සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවද ඇතුළු සෑම පුද්ගලයෙකු විසින්ම විශ්ව කාලාන්තර සමාලෝචන ජාතික වාර්තාව සැකසීමේ ක්‍රියාවලිය මුළුල්ලේ දක්වන ලද සහය හා දායකත්වය වෙනුවෙන්ද, ඔවුන්ගේ ඡායා වාර්තා සම්බන්ධයෙන්ද මම ස්තුතිවන්ත වෙමි.

- තවද මෙහි සිටින ක්‍රියාකාරී කණ්ඩායම සහ එක්සත් ජාතීන්ගේ සාමාජික රටවලටද මාගේ ස්තුතිය හිමිවේ.

- උප සභාපතිතුමනි, මා ඔබතුමාටද, තාක්ෂණික සහයෝගය දැක්වීම සම්බන්ධයෙන් ක්‍රියාකාරී කණ්ඩායමේ ලේකම් කාර්යාලයටද, ශ්‍රී ලංකා සමාලෝචනය සම්බන්ධයෙන් බුරුන්ඩි, කොරියා ජනරජය සහ වෙනිසියුලාව යන රටවල් ලබාදුන් සහයෝගයටද ස්තුතිවන්ත වෙමි.

- දැන් අපි සාමාජික රාජ්‍යයන්ට සවන් දෙමු. අවශ්‍ය පරිදි මාත් මාගේ නියෝජිත කණ්ඩායමත් ඔවුනට ප්‍රතිචාර දැක්වීමට අපේක්ෂා කරමු.

ස්තුතියි.